## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව
## ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.12,492,108 ක් සියලු වැඩ සටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ආයුර්වේද ආධාර ලෙස ලැබී තිබූ රු.329,412 ක් වටිනා බෙහෙත් තොගය සහ රු.329,400 ක් වටිනා තාර ලීටර් 3600 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනාව රු.1,129,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.637,800 ක් ලෙස දක්වා තිබීමෙන් සභික දීමනා වියදම රු.491,200 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුම් සඳහා වැයකර තිබූ රු.171,150 ක් පුනරාවර්තන වියදම් ලෙස නොදක්වා ප්‍රාග්ධන වැය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.2,194,524 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු.2,194,524 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්මේ ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු රු.7,498,394 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වැය සහ ණයහිමියන් රු.7,498,394 ක් අඩුවෙන් ද, එකී මුදල මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර හා මූලධන ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් වර්ෂයේ මූලධන ආදායම් හා ණයගැති ශේෂය රු.7,498,394 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.1,696,102 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.1,696,102 කින් වැඩියෙන් ද, සමුච්චිත අරමුදලේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඌ) අළුත්වල ළමා උයන සඳහා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී ගෙවා තිබූ රු.400,000 ක අත්තිකාරම වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.400,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී මීටියාගොඩ සතිපොල ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.2,340,023 ක වියදම හා මීටියාගොඩ වෙළඳ සංකීර්ණය අත්පත් කර ගැනීම සඳහා වන්දි ලෙස ගෙවූ රු.245,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.2,019,667 ක් වුවද, වර්ෂයේ ආදායම් ලෙස රු.1,000,000 ක් පමණක් ප්‍රතිපාදනය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,019,667 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.3,658,873 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.193,335,467 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ශේෂ තහවුරු සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,660,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,899,015 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් බදු

සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස විදුලි පහසුකම්, දුරකථන පහසුකම්, ජල පහසුකම් හා ප්‍රාදේශීය සභාව විසින් කැලිකසල ඉවත් කිරීම කරනු ලබන පහසුකම් පවතින බටපොල නගරය වැනි ප්‍රදේශ තිබියදීත් එම ප්‍රදේශ හඳුනාගෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සහකාර කොමසාරිස්වරයාගේ සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 අක්කර බදු හා බදුකුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.164,067 ක් වූ අක්කර බදු සහ රු.85,555 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 2,437,677 ක උසාවි දඩ හා රු. 20,000,000 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

#### 2.2.4 කඩ කාමර බදුදීම

සභාවට අයත් වෙළඳ සංකීර්ණවල කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 අප්‍රේල් මාසයේදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා තිබූ නව තක්සේරුව අනුව ප්‍රතිශෝධිත කඩ කුලී අය නොකිරීමෙන් 2013 වර්ෂය තුළ කඩ කාමර 36 කින් රු.612,400 ක වාර්ෂික කුලියක් සභාවට අහිමි වී තිබුණි.

(ii) කඩ ලබාදීමේදි බදුකරු සමඟ ඇති කරගත් ගිවිසුමේ 06 වන කොන්දේසියේ සඳහන් පරිදි බදුකරු විසින් කඩ කාමරයක හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් අයෙකුට විකිණීම, පැවරීම හෝ අතුරු බදුදීම සභාවේ ලිඛිත අවසරය නැතිව නොකළ යුතු වුවද කඩ කාමර 07 ක් අතුරු බදු දී තිබුණි. මීට අමතරව ගිවිසුමෙහි 20 වන කොන්දේසිය අනුව කඩ කාමර, බඩු ගබඩා සේ පාවිච්චි කිරීම නොකළ යුතු වුවද කඩ කාමර 03 ක බඩු ගබඩා කර තිබුණි.

(iii) දකුණු පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 2010/01 දරන චක්‍රලේඛය මඟින් සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු බව දන්වා තිබුණ ද බදු දී තිබූ කඩ කාමර 36 සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව 2011 සහ 2012 වර්ෂ සඳහා සභාවේ සභාපති, උප සභාපති ඇතුළුව කිසිදු මන්ත්‍රීවරයෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණු අතර, 2013 වර්ෂය සඳහා සභාපති, උප සභාපති සහ මන්ත්‍රීවරුන් 08 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

### 3.2 නිෂ්ක්‍රීය වත්කම්

-----------------

සභාව සතු අත් ට්‍රැක්ටර් දෙකක් වසර 05 – 09 දක්වා වූ කාලපරිච්ඡේදයක් තුල නිෂ්ක්‍රීයව පැවති බව 2013 දෙසැම්බර් 13 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

## 4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය